**ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------------------- | ----------- |
| (අ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ඒකාබද්ධ සාරාංශ වාර්තාවේ අනෙකුත් ආයතනවලින් මාරුකිරීම් යටතේ දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාරුකිරීම් ලෙස දක්වා ඇති රු.35,831,907 ක් අදාල උපලේඛනයේ රු.2,831,907 ක් ලෙද දක්වා තිබූ බැවින් රු.33,000,000 ක වෙනසක් පැවතුණි. | ප්‍රමාද දෝෂයක් හේතුවෙන් මෙම වරද සිදුවී ඇත. | මෙම වෙනස ලේඛනවල නිවැරදි කරගත යුතු වීම. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මූල්‍ය නොවන වත්කම් පිළිබඳව කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත යවන ලද වාර්තාව හා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ පැවති විවිධ වත්කම් ඒකකයන් අතර රු.61,442,495 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට අමතරව රු.194,519,038 ක තවත් වත්කම් ශේෂයන් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත යවා තිබූ වාර්තාවෙහි ඇතුළත් වුවද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් කර නොතිබුණි. | මෙම වාර්තා දෙකෙහි වත්කම් සංකේත අංකයන්ගේ පැවති වෙනස්කම් හේතුවෙන් මෙම වරද සිදුවී තිබූ අතර එම වාර්තාව එකිනෙකට සැසඳෙන ආකාරයට සකස් කිරීමට කටයුතු කරමි. | මෙම වෙනස නිවැරදි කරගෙන ලේඛන යාවත්කාලීන කරගත යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් හා මූල්‍ය ප්‍රකාශනයන්හි මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් වත්කම් ඒකක 08 ක ආරම්භක ශේෂයන් අතර, රු.මිලියන 788.63 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී මෙම වෙනස විශ්ලේෂණය කොට නිවැරදි කිරීමට කටයුතු කරමි. | මෙම වෙනස්කම් කඩිනමින් නිවැරදි කරගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක හඳුනාගන්නා ලද ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 42.7 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණු අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අයත් ඉඩම් ප්‍රමාණය හඳුනා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | මෙම කර්තව්‍ය තක්සේරු දෙපාර්තමේන්තුව වෙත පවරා ඇතත් මෙතෙක් එම තක්සේරු වාර්තා ලැබී නොමැති වීම මෙම තත්ත්වයට හේතුවී ඇත. | කඩිනමින් මෙම කටයුතු අවසන් කරවාගෙන එම ඉඩම්වල වටිනාකම් වාර්තාවලට ඇතුළත් කළ යුතු වීම. |

**1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

-----------------------

**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ භෞතික වත්කම් විකිණීම යටතේ දැක්විය යුතු වර්ෂය තුළ ජංගම නොවන වත්කම් විකිණීමෙන් ලැබී තිබූ රු.625,894 ක් වෙනත් ශීර්ෂවලින් එකතු කරන ලද ආදායම් ලෙස දක්වා තිබුණි. | මෙය කාර්යාල උපකරණ හා අබලි ද්‍රව්‍ය අපහරණය කිරීමේදී ලද මුදලක් වන බැවින් එය වෙනත් ශීර්ෂවලින් එකතු කරන ලද ආදායම් යටතේ දක්වා ඇත. | එම වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දැක්විය යුතු වීම. |

**1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂය**

-----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවල වැඩ කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් වශයෙන් එකතුව රු.18,947,261 ක් ගෙවා තිබූ නමුත් වර්ෂය අවසන් වනවිට තව දුරටත් අයවිය යුතුව පැවති රු.10,782,006 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ 5 (ඒ) හා ඒසීඒ 5 (බී) ආකෘතීන් යටතේ හෙළිදරව් කර නොතිබුණු අතර මෙම වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය වත්කම් හා කුලී වැඩ අත්තිකාරම් සංචිත යටතේ ද දක්වා නොතිබුණි. | මෙම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. | මෙම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ආකෘතීන් යටතේ හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි නිවැරදිව සටහන් කළ යුතු වීම. |

## 1.6.4 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගියද, එම ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මේ පිළිබඳව වගකිවයුතු නිලධාරීන් වෙත උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ලේඛන හා පොත්පත් යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු වීම. |

## 1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් අනෙකුත් ආයතනවලින් අත්පත් කරගත් වත්කම්, අපහරණය හා අගය වෙනස්වීම් පිළිබඳ වත්කම්වල වටිනාකම් යනාදිය කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවෙහි ඇතුළත් කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකමේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය. | වත්කම් සංකේත අංකයන්ගේ වෙනස්කම් හා මූල්‍ය වටිනාකම් යෙදීමට පහසුකම් සලසා නොතිබීම මෙයට හේතුවී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව වත්කම් වටිනාකම් එම වාර්තාවේ සඳහන් කිරීමට කටයුතු කළ යුතු වීම. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂය සඳහා පිළියෙල කළයුතු අක් මුදල් සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | භාණ්ඩාගාරය විසින් අක් මුදල් සැලැස්මක් ඉල්ලා නොමැතිවීම හේතුවෙන් එවැන්නක් සකස් නොකරන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 13,369.3 ක ප්‍රතිපාදනයන් ඉල්ලුම් කර තිබුණද රු.මිලියන 6,086.6 ක ප්‍රතිපාදනයක් පමණක් ලැබී තිබුණි. වර්ෂයේ ජූලි සහ දෙසැම්බර් යන මාස | අවස්ථානුකූලව පැනනඟින මුදල් අවශ්‍යතා මත භාණ්ඩාගාරය විසින් අග්‍රිම ලබාදීම නිසා මෙම තත්ත්වය ඇතිවී ඇත. | මෙම තත්ත්වය හැකිතාක් අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

දෙක සඳහා ඉල්ලුම් කළ අග්‍රිමයට වඩා ලද අග්‍රිමය පිළිවෙලින් රු.මිලියන 71.6 ක් හා රු. මිලියන 650.2 ක් ලෙස සියයට 15 කින් හා සියයට 117 කින් වැඩියෙන් ලැබී තිබුණි. අනෙකුත් මාස 10 සඳහා ඉල්ලුම් කළ අග්‍රිමයට වඩා අඩුවෙන් අග්‍රිම ලැබී තිබූ අතර එය රු. මිලියන 24 ක හා රු. මිලියන 1,820 ක පරාසයක් ගෙන තිබුණි.

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා ව්‍යාපෘති 08 ක් වෙනුවෙන් රු.මිලියන 64.6 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි. ඉන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු. මිලියන 28.4 ක වියදමක් දරා තිබුණ අතර රු. මිලියන 36.1 ක ඉතිරියක් වී තිබුණි. | කොවිඩ් -19 වසංගතයේ බලපෑම මෙයට හේතුවූ බව දන්වා තිබුණි. | ප්‍රතිපාදන උපරිම අයුරින් උපයෝජනයට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයකට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 46 ක හා මූලධන වැය විෂයයන් 02 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 9 ක හා සියයට 56 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. නියමිත පරිදි ඇස්තමේන්තු සකස් නොකිරීම හා ලබාදී තිබූ ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය නොකිරීම නිසා මෙලෙස ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | අපේක්ෂිත පරිදි වියදම් සිදු නොකිරීම මෙයට හේතුවී තිබේ. | අපේක්ෂිත වියදම තාත්ත්වික වන ආකාරයට පුරෝකථනය කිරීමටත් ලැබෙන මුළු ප්‍රතිපාදනයම උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | වැය විෂයයන් 09 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා වෙනත් වැය විෂයයන් 07 කින් සියයට 0.1 සිට සියයට 19 දක්වා පරාසයකින් ප්‍රතිපාදන මාරුකර වියදම් කර තිබුණි. | වෙන්කර ගන්නා ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මෙයට හේතුවී තිබේ. | වියදම් අවශ්‍යතාවයන් හැකිතාක් නිවැරදි විය හැකි ආකාරයට පුරෝකථනය කිරීම කළ යුතු වීම. |
| (ඈ) | වැය විෂයයන් 07 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා එම ප්‍රතිපාදනයන්ගෙන් සියයට 01 සිට සියයට 35 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමට කටයුතු කර තිබුණි. | වියදම් කළමනාකරණය හේතුවෙන් මෙම වැය විෂයයන්හි ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | -එම- |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පෙර වර්ෂයට අදාළ රු.1,113 ක බැරකම් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මු. රෙ. 115 යටතේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. | මෙම බැරකම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

අමාත්‍යාංශ 46 කින්, දෙපාර්තමේන්තු 23 කින් හා වෙනත් ආයතන 05 කින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පිළිවෙලින් රු.මිලියන 4,695 ක්ද, රු.මිලියන 305 ක්ද හා රු.මිලියන15 ක් ද ලෙස එකතුව රු.මිලියන 5,015 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. එම ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පිළිවෙලින් රු.මිලියන 4,648 ක්ද, රු.මිලියන 287 ක්ද හා රු.මිලියන 15 ක්ද ලෙස එකතුව රු.මිලියන 4,950 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පිළිවෙලින් රු.මිලියන 47 ක්ද, රු.මිලියන 18 ක්ද හා රු.මිලියන 0.1 ක්ද ලෙස ප්‍රතිපාදනයෙන් එකතුව රු. මිලියන 65 ක් ඉතිරිවී තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 1.01 ක්ද, සියයට 5.74 ක් ද හා සියයට 0.66 ක්ද විය.
.

## 2.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතිකවීම කළ යුතුව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික වියයුතු වුවත් වාර්තාවේ 3.7 ඡේදය ප්‍රකාරව විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී නොතිබුණි. | විවිධ අංශයන්ගෙන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් පිළිතුරු ගෙන්වා ගැනීමට සිදුවීම නිසා මෙම ප්‍රමාදයන් වේ. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| xxiv පරිච්ඡේදයේ 4.4 ඡේදය හා 4.5 ඡේදය | රජයට අයවිය යුතු මුදල් ප්‍රධාන ණයකරුගෙන් අයකරගත නොහැකි අවස්ථාවලදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම නිසා දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ තහනම් කළ නිලධාරියෙකුගෙන් ද කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය හැරගිය නිලධාරියෙකුගෙන් ද අයවිය යුතු රු.87,852 ක ණය ශේෂයන් වසර 05 කට අධික කාලයක් නිරවුල් කර නොතිබුණි. | නීතිපති උපදෙස් ලද වහාම මේ පිළිබඳව නීත්‍යානුකූලව කටයුතු කිරීම ආරම්භ කරමි. | මෙම මුදල් කඩිනමින් නිරවුල් කර ගැනීමට ක්‍රියාකළ යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 215(1) හා මුදල් රෙගුලාසි 218 | කිසියම් කාර්යයක යෙදවීමේ අදහසින් මොනම හේතුවක් නිසා වුවද නියමිත දිනට කලින් ගෙවීම් නොකළ යුතුය. එහෙත් වැය විෂයයන් 02 කට අදාළව බිල්පත්වල වටිනාකමට වඩා වැඩිපුර ගෙවූ රු.8,248 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගලපා නොතිබුණි. | වැඩිපුර ගෙවීමක් සිදුවී ඇත්නම් ඉදිරියේදී එය මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම සිදු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 1645(ආ) හා 1646 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 06 ක දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | දැනට ධාවනයේ පවතින වාහනවලට අදාළව දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර ඇත. | ධාවනයේ පවතින සියළුම වාහනවල ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වීම. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>--------------- | | | |
| | (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන සම්බන්ධව ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකළ යුතු වුවද එවැනි ඉන්ධන පරීක්ෂාවක් විගණිත දිනය වූ 2021 පෙබරවාරි 28 දින වනවිටත් සිදුකර නොතිබුණි. | මේ සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | (ii) 2006 ජූලි 14 දිනැති අංක11/2006 චක්‍රලේඛයේ 3(iv) වගන්තිය | වෙන්කළ වාහන 02 කට අදාළව පොදු 238 දෛනික ධාවන සටහන් වෙනුවට චක්‍රලේඛය පරිදි සටහනක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මෙම ධාවන සටහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවත්වාගෙන ගොස් ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර විගණනය වෙත ධාවන සටහන් එවිය යුතු වීම. |
| | (iii) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන චක්‍රලේඛයේ 1 ඡේදය | රාජකාරි කටයුතු සඳහා සහ කාර්යාලය සහ නිවාසය දක්වා යාම් ඊම් වෙනුවෙන් නිළ වාහනයක් යොදාගත හැකි වුවත්, ඊට අනුකූල නොවී දිස්ත්‍රික් ලේකම් වෙත නිළ වාහන 02 ක් වෙන්කර තිබුණි. | නිළ වාහනය නිතරම අළුත්වැඩියාවන් සිදුකිරීමට භාජනය වන බවත් මේ නිසා අමතර කැබ්රථයක් තබා ගැනීම අත්‍යවශ්‍ය බවත් දන්වා තිබූ අතර ඒ සඳහා රජයේ ඉන්ධන භාවිතා කරනු නොලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

(ඇ) මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ
-------------------------

| | | | |
|---|---|---|---|
| 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි 7 ඡේදය | 2018 වර්ෂයේ සිට ආයතන විසින් අත්පත් කරගනු ලබන හා අපහරණය කරනු ලබන සියළුම වත්කම්වලට අදාළ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තාකර නොතිබුණි. | 2018 හා 2019 වර්ෂවල මෙම තොරතුරු සැපයීමට අවශ්‍ය පහසුකම් නිසි අයුරින් සපයා නොමැතිවීම මෙයට හේතුවී ඇත. | වත්කම් වටිනාකම්වල ඇතිවන වෙනස්වීම් යාවත්කාලීන කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතු වීම. |

**2.7 කොන්ත්‍රාත් සම්බන්ධයෙන් බදු අයකර ගැනීම්**
-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 නොවැම්බර් 29 දිනැති වැට් බදු සංශෝධන චක්‍රලේඛය අනුව 2019 දෙසැම්බර් 01 දින සිට ගෙවිය යුතු වැට් බදු ප්‍රතිශතය සියයට 15 සිට සියයට 8 දක්වා අඩුකර තිබුණද ගම්පෙරලිය වැඩසටහන යටතේ ආගමික ස්ථාන සඳහා සූර්ය පැනල සවිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කාර ආයතනයක් වෙත 2019 දෙසැම්බර් 29 දින අවසන් බිල්පත් ගෙවීමේදී සියයට 15 බැගින් එකතුව රු.1,015,980 ක වැට් බදු ගෙවා තිබුණි. | ගෙවීම් බිල්පත් ඉදිරිපත් කිරීම මෙම බදු සංශෝධන චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර සිදුකර තිබූ බැවින් මෙලෙස ගෙවීම් සිදුකර ඇත. | වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**2.8 අවිධිමත් ගනුදෙනු**
---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016 ඔක්තෝබර් 05 දිනැති අංක HAF/ADMIN/DRIVERS/2016/23 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) ගේ ලිපිය මගින් බස්නාහිර පළාත් ප්‍රවාහන අමාත්‍යාංශයේ පළාත් රාජ්‍ය සේවයේ රියදුරකු වැටුප් ප්‍රතිපූර්ණය කිරීමට යටත්ව 2016 ඔක්තෝබර් සිට දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත අනුයුක්ත කර තිබුණද, 2019 ඔක්තෝබර් සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා ගෙවන ලද රු.542,070 ක් වූ වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කර නොතිබුණු අතර මෙම අනුයුක්ත කිරීම සඳහා විධිමත් අනුමැතියක් ද නොතිබුණි. | මේ පිළිබඳව ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් ගේ හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ඉල්ලා ඇත. | මෙම වැටුප් ගෙවීම් හා තනතුර විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු රජයේ නිල නිවාස 2014 අගෝස්තු මාසයේ සිට 2017 ජූලි 12 දින දක්වා කාලය සඳහා වෙනත් ප්‍රදේශයක ප්‍රාදේශීය ලේකම්වරයකු වෙත ලබාදී තිබුණද ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5.7 ප්‍රකාරව නිවාස කුලී අයකරගෙන නොතිබුණි. | මේ පිළිබඳව නිසි ක්‍රියාමාර්ග ගන්නා ලෙස මාතර ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇත. | ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදයේ 5.7 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.9 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ එකතුව රු.56,479,262 ක් වූ වසර 02 ක් ඉක්මවූ තැන්පතු 196 කට අදාළ ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ඉන් රු.10,225,831 ක් වූ තැන්පතු 39 ක් වසර 05 ඉක්මවා තිබුණි. | මෙම ශේෂයන් පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කඩිනමින් කටයුතු කරමින් ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවද, මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුව සඳහා පමණක් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. | 2020 වර්ෂයේ පළමු කාර්තුව සඳහා පමණක් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන (**RRDP**) 2019 යටතේ වැලිගම මැතිවරණ කොට්ඨාශයේ ආගමික ස්ථාන සඳහා සූර්යබල පහසුකම් ලබාදීමේ | පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව දන්වා තිබුණි. | ව්‍යාපෘති වලට අදාළ පසුවිපරම් කටයුතු සිදුකර නිවැරදි කිරීම් සිදුකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘති යටතේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පූජනීය ස්ථාන 41 ක් හා වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පූජනීය ස්ථාන 34 ක් අතුරින් ආගමික ස්ථාන 18 ක සූර්ය කෝෂ මගින් ජනනය වන විදුලි ඒකක ප්‍රමාණය ඉතා අවම මට්ටමක පැවතුණි. | | |
| (ආ) | අදාළ කොන්ත්‍රාත් ආයතනය විසින් මුදල් ලබාගෙන තිබුණද නිසි පරිදි විදුලිබල මණ්ඩලය වෙත අයදුම්පත් ඉදිරිපත් නොකිරීම හා මුදල් නොගෙවීම මත විදුලි සම්බන්ධතාවය ලබාදී නොතිබුණු ආගමික ස්ථාන ගණන 10 ක් විය. | විවිධ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී ඇති බව දන්වා තිබුණි. | මෙම කටයුතු විධිමත් කරගත යුතු වීම. |
| (ඇ) | නිසි ලෙස විදුලිබල සම්බන්ධතාවය ලබාදුන් ආගමික ස්ථානවල ප්‍රධානීන් සමඟ විදුලිබල මණ්ඩලය ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව දන්වා තිබුණි. | ගිවිසුම් වලට එළඹීම් සඳහා කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | සුනිත්‍ය බලශක්ති අධිකාරියේ තාක්ෂණ නිලධාරි විසින් ඉදිරිපත් කර තිබුණු ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව මගින් නිසි පරිදි ඉටු නොකෙරුණ වැඩ කොටස් හා තව දුරටත් වැඩි දියුණු කළයුතු දෑ සඳහන් කර දිස්ත්‍රික් ලේකම් දැනුවත් කර තිබුණද, එම අඩුපාඩු හා වැඩිදියුණු කිරීම් කොන්ත්‍රාත්කරුගෙන් ඉටුකරවා ගැනීමකින් තොරව, ආයතන **03** ක් වෙත සූර්ය කෝෂ **75** ක් සවිකිරීම වෙනුවෙන් බදු රහිතව රු.මිලියන **32** ක් ගෙවා තිබුණි. | සියයට **10** රඳවුම් මුදල් තබාගෙන එම මුදල් නිදහස් කර ඇත. | මෙම තත්ත්වයන් නිවැරදි කරගත යුතු වේ. |

## 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.500,000 ක ඇස්තමේන්තුගත මුදලක් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා කාලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ඉටු කර නැත. | ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ හා අනුමත කර ගැනීමේ කාල වකවානු සාධාරණ හා තාත්වික විය යුතු වීම. |

## 3.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සපිරි ගමක් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන හා ග්‍රමීය පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද එකතුව රු. මිලියන 20 ක ඇස්තමේන්තු වටිනාකම් සහිත ව්‍යාපෘති 35 ක් නියමිත කාලය තුලදී වැඩ අවසන් නොකිරීම නිසා දින 10 සිට දින 169 ක ප්‍රමාද කාලයකින් පසුව වැඩ අවසන් කර තිබුණි. | කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් රට තුළ පැවති වාතාවරණය මෙයට හේතු විය. | ගිවිසුම්ගත කාලසීමාව තුළදී ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමට ද එසේ නොවන විටදී සාධාරණ හේතුන් මත දින දීර්ඝ කරවීමට ද කටයුතු කළ යුතු වීම. |

## 3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මාතර නිල්වලා සංවර්ධන ව්‍යාපෘතිය **2018 - 2020** සඳහා අභ්‍යන්තර ස්වදේශ කටයුතු සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට **2019** හා **2020** වර්ෂ සඳහා එකතුව රු. මිලියන **715** ක් ලබා දී තිබුණු අතර**, 2019** ජනවාරි **10** දිනැති අංක **MNPEA/PLN/2019** දරන ජාතික ප්‍රතිපත්ති ආර්ථික කටයුතු හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමත කරගෙන නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ කාර්යයන් වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මකට ඇතුළත් කර විෂයභාර අමාත්‍යාංශය වෙතින් අනුමත කර ගැනීමෙන් තොරව ක්‍රියාත්මක කර තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හඳුනාගත් මෙම ව්‍යාපෘති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මගින් අනුමත කර ක්‍රියාත්මක කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) **2019** නොවැම්බර් **20** දිනැති අංක **BD/GPS/ISS/09/01/NA/2019** දරන සියලුම දිස්ත්‍රික් ලේකම්වරු ඇමතු භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය ප්‍රකාරව දැනට වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘති නැවත සමාලෝචනය කර දන්වන තෙක් | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තීරණය මත භාණ්ඩාගාර ලේකම් දැනුවත් කර මෙලෙස සිදුකරන ලද බව දන්වා තිබුණි. | අදාළ ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | තාවකාලිකව අත්හිටුවන ලෙස දැනුම් දී තිබූ නමුත් ඊට අනුකූල නොවී **2020** දෙසැම්බර් මස **23** දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව විසින් එකතුව රු.මිලියන **254.4** ක් වූ ජලනල දීර්ඝ කිරීමේ නව ව්‍යාපෘති **14** ක් ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රසම්පාදන තීරණ ගෙන තිබුණි. | | |
| (ඇ) | **2020** අගෝස්තු **31** දින වනවිට ජලනල දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියකට අදාළව ව්‍යාපෘතීන් **09** ක් සඳහා වටිනාකමේ එකතුව රු.මිලියන**35.4** ක් වූ චෙක්පත් **04** ක් කළමණාකරු (ක්‍රි.හා.න) ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මාතර වෙත නිකුත් කර තිබුණද **2021** මාර්තු වනවිට එකතුව රු. මිලියන **33.8** ක් වූ ව්‍යාපෘති **07** ක ප්‍රතිලාභීන් විසින් ජලනල එළීම සඳහා කාණු නොකැපීම මත ව්‍යාපෘතිවල වැඩ නිමකර නොතිබුණි. ව්‍යාපෘති වටිනාකමින් සියයට **30** ක් වූ ජලනල හා උපාංග පමණක් මිලදීගෙන තිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී නිසි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි. | මෙලෙස නිෂ්කාර්යව පවතින මුදල් සම්බන්ධයෙන් කඩිනමින් නිසි ක්‍රියා මාර්ග ගැනීමට මෙන්ම ප්‍රතිලාභීන්ට එම ව්‍යාපෘතිවල ප්‍රතිලාභ කඩිනමින් සලසා දීමටත් කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | නිල්වලා එළිය ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තු වටිනාකමේ එකතුව රු.මිලියන **78.6** ක් වූ ඉදිකිරීම් කර්මාන්ත **09** ට අදාළ එකතු වටිනාකම රු.**3,844,624** ක් වූ කාර්යසාධන බැඳුම්කර **09** ක වලංගු කාල සීමාව ඉකුත් වී මාස **02** ත් මාස **11** ත් දක්වා පරාසයක පැවතියද අදාළ ඉදිකිරීම් කර්මාන්තවල වැඩ අවසන් වී නොමැති අතර**,** කොන්ත්‍රාත් කාලසීමාව ද දීර්ඝ කර නොතිබුණි. | මෙම සුරක්ෂණයන්ගේ වලංගු කාල සීමාව දීර්ඝ කරදෙන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් ලබාදී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | **2020** මැයි **15** දිනැති අංක **DSM/DPS/Nilwala/24/2019** දරන දිස්ත්‍රික් ලේකම් මාතර මගින් ලේකම් රාජ්‍ය පරිපාලන**,** ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය අමතා යොමු කර තිබූ ලිපිය මගින් මෙම ව්‍යාපෘතියට අදාළව **2019** දෙසැම්බර් **31** දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කර තිබුණි. එහිදී භෞතික ප්‍රගතිය සියයට **100** ක් ලෙස පෙන්නුම් කරමින් අතැති බිල් ලෙස කර්මාන්ත **48** ට අදාලව එකතුව රු.මිලියන **400.55** ක් | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හරහා ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් සඳහා වැඩ ආරම්භ කිරීමට පෙර මුදල් ගෙවීමට සිදුවීම මෙයට හේතුවී ඇත. | ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීමේදී නිවැරදි තත්ත්වය පෙන්නුම් කිරීමටත් මෙම ව්‍යාපෘති කඩිනමින් නිම කරවා ගැනීමටත් කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වටිනාකමින් යුතු බිල්පත් පවතින බව සඳහන් කරමින් ඊට අදාළ අක්මුදල් ලබාදෙන ලෙසට ඉල්ලීම් කර තිබුණි. එහෙත් එම අතැති බිල් ලෙස ඉදිරිපත් කර තිබූ රු.මිලියන **329** කට අදාළ කර්මාන්තවල කිසිදු භෞතික ප්‍රගතියක් නොතිබුණි. | | |
| (ඊ) | ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළයුතු කර්මාන්ත **05** ක් සඳහා ජාතික තරඟකාරී මිල කැඳවීම් ක්‍රමය මගින් පුවත්පත් දැන්වීම පළකර මිල ගණන් කැඳවා තිබුණද පසුව එම ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන කටයුතු ආරම්භ නොකර අවලංගු කර තිබුණි. ඒ අනුව පුවත්පත් දැන්වීම් සඳහා දැරූ එකතුව රු.**166,174** ක් නිෂ්කාර්ය වියදම් වී තිබුණි. | ඇස්තමේන්තු සංශෝධනය කිරීමට සිදුවීම මෙයට හේතුවී ඇත. | මෙම නිෂ්කාර්ය වියදම පිළිබඳව නිසි ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (උ) | වරාය සහ නාවික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක සිංහරාජ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ මාතර දිස්ත්‍රික්කයේ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කරන ලද ජල යෝජනා ක්‍රම 03 ක් අතුරින් රු.මිලියන23.3 ක් වටිනා ව්‍යාපෘති දෙකක් විගණිත දිනය වූ 2020 අගෝස්තු 20 දින වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා ගිවිසුම්ගත වීමකින් තොරව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත 2019 ජූලි 10 දින රු.මිලියන 10.4 ක් සහ 2019 නොවැම්බර් 21 දින රු.මිලියන 14.7 ක් ගෙවා තිබුණි. | මෙම ව්‍යාපෘති කඩිනමින් නිමකර දෙන ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ඉල්ලා ඇති බවත් ඉදිරියේදී මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ගිවිසුම්ගතවීමේ හැකියාව පිළිබඳව සොයා බැලීමට කටයුතු කරමි. | මෙම ව්‍යාපෘති කඩිනමින් ඉටුකරවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

.

**3.6 වත්කම් කළමනාකරණය**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | --------------------- | ------------ |
| (අ) | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු මහින්ද විජේසේකර ක්‍රීඩාංගනය 2018 මැයි 22 දින සිට අවිධිමත් ලෙස මාතර දිස්ත්‍රික් ලේකම් වෙත පවරාගෙන මාතර දිස්ත්‍රික් රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමයක් පිහිටුවා එම සංගමයට පවරාදී තිබූ අතර, | මෙම ක්‍රීඩාංගනය නැවත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පවරාගෙන ආදායම රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය වත්කම් පිළිබඳව විධිමත් පරිදි කටයුතු කළ යුතු වීම. |

ක්‍රීඩාංගනය වෙන්කිරීමේ ආදායම රජයේ ආදායමට නොගලපා ක්‍රීඩා සංගමයේ බැංකු ගිණුමට බැරකර තිබුණි.

(ආ) වාහන උපයෝජනය

| | | | |
|---|---|---|---|
| (i) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 සතුව පවතින වාහන 34 ක් අතුරින් කැබ් රථ 02 ක් සඳහා වර්ෂය තුළ රියදුරු වැටුප් හා දීමනා හැර අනෙකුත් වියදම් ලෙස රු.462,580 ක් හා රු.393,105 ක් වැයකර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ ඒවා ධාවනය කර තිබූ කිලෝමීටර් ප්‍රමාණය පිළිවෙලින් 5071 ක් හා 9220 ක් වූයෙන් එක් කිලෝමීටරයක වියදම පිළිවෙලින් රු.91.22 ක් හා රු.42.64 ක් වී තිබුණි. | මෙම වාහනය පැරණි වාහනයක් බැවින් දෝෂ හා අළුත්වැඩියාවන් අධික වීම මෙයට හේතුවී ඇත. | පැරණි වාහන පිළිබඳව විධිමත් ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 සතුව ත්‍රිරෝද රථ 11 ක් පැවති අතර ඒ සඳහා වර්ෂය තුළදී රියදුරු වැටුප් හා දීමනා හැර අනෙකුත් වියදම් ලෙස රු.537,236 ක් දරා තිබුණි. ඒ අතුරින් ත්‍රිරෝද රථ 02 ක් වර්ෂය තුළ කිසිදු ධාවන කටයුත්තකට යොදවා නොතිබුණු අතර ත්‍රිරෝද රථ 02 ක් වර්ෂය තුළදී කිලෝමීටර් 114 ක් හා කිලෝමීටර් 500 ක් පමණක් ධාවනය කර තිබීම නිසා කිලෝමීටරයක වියදම පිළිවෙලින් රු.81.76 ක් හා රු.26.23 ක් වී තිබුණි. | රියදුරන් නිශ්චිතව වෙන්කර නොමැති බැවින් සේවා අවශ්‍යතාවය මත කාර්යාල කාර්ය සහායකයින් යොදවා කටයුතු කර ඇත. | මෙම රථ උපරිම ප්‍රයෝජනයක් ලැබෙන පරිදි පරිහරණය කිරීම සඳහා වැඩි අවශ්‍යතාවයක් ඇති ආයතන පවතී නම් එමආයතන වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.7 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 10 කට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 06 කට අදාළ පිළිතුරු 2021 මාර්තු 29 දින වනවිටත් ලැබී නොතිබුණි. | විවිධ අංශ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමෙන් පසු කඩිනමින් පිළිතුරු එවීමට කටයුතු කරමි. | නිසි කාල වකවානුව තුළ පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | | | |
| (i) | ශීර්ෂ අංක 194 ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදිත රු. මිලියන 20 ක් හා ශීර්ෂ අංක 219 ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදිත රු. මිලියන 75 ක් මත ක්‍රීඩාංගනවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැඩසටහන 2020 යටතේ වොලිබෝල් ක්‍රීඩා පිටි 38 ක් හා පොදු ක්‍රීඩාංගන 02 ක් සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 100 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණි. 2020 වර්ෂය තුළදීම අවසන් කිරීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘති අතුරින් 2020 නොවැම්බර් 17 දින වන විටත් ව්‍යාපෘති 14 ක් සම්බන්ධයෙන් ගිවිසුම්ගතවී නොතිබුණු අතර, ව්‍යාපෘති 06 ක් සංශෝධිත ස්ථාන හඳුනාගෙන අනුමැතියට යොමු කර තිබුණි. ව්‍යාපෘති 02 ක් සම්බන්ධව කිසිදු ඉදිරි කටයුත්තක් සිදු කර නොතිබුණි. මේ අතුරින් කාණ්ඩ 3 කට අයත් ව්‍යාපෘති 10 ක් 2020 නොවැම්බර් 17 විගණිත දිනය වනවිටත් වැඩ අවසන් කර නොතිබුණ ද ගිවිසුම් කොන්දේසි 6.4 අනුව කටයුතු කර නොතිබුණි. | පැවති කොවිඩ් -19 වසංගත තත්ත්වය මෙයට බලපා ඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | **DSM/DPS/VB/B** කාණ්ඩයේ කාර්යසාධන බැඳුම්කරයේ වලංගු කාලය 2020 සැප්තැම්බර් 30 දිනෙන් කල් පිරී තිබූ නමුත් දින දීර්ඝ කර නොතිබුණි. | බිල්පත් ගෙවීමේදී කාර්යසාධන බැඳුම්කරයේ වටිනාකම අඩුකර පොදු තැන්පත් ගිණුමේ ගිණුම්ගත කර ඇත. | නියමිත කාලයේදී කාර්යසාධන බැඳුම්කරවල කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iii) | ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව හා ගිවිසුම්ගතවීමකින් තොරව මාකඳුර ඩැනී හිත්තැටිය ක්‍රීඩාපිටිය, අකුරැස්ස ඇල්ලේවෙල කනිටු විද්‍යාලය ක්‍රීඩාපිටිය, දික්වැල්ල වලස්ගල වොලිබෝල් ක්‍රීඩාපිටිය හා යටියන වයර්ලස් වත්ත ඉඩම තුළ ක්‍රීඩාපිටිය යන ව්‍යාපෘති ඉදිකිරීම් නිමකර තිබුණි. | පිළිතුරක් ඉදිරිපත් කර නැත. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පරිපාටිය නිවැරදිව අනුගමනය කළ යුතු වීම. |
| (iv) | මාර/කිරින්ද පුහුල්වැල්ල මහා විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සංවර්ධනය සඳහා 2019 වර්ෂයේ රුපියල් මිලියනයක ප්‍රතිපාදන වෙන්කර එයින් රු.898,582 ක් වැයකර දුර පැනීම් වලක් ඉදිකර තිබුණද එය අවහිර වන පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැළසුම් අංශය විසින් රුපියල් මිලියන 2.16 ක් වැයකර දිවා/රාත්‍රී වොලිබෝල් පිටියක් සකස් කර තිබීම නිසා එම වියදම නිශ්කාර්ය වී තිබුණි. ව්‍යාපෘතිය නිමකිරීමෙන් පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙන්ම පූර්ව විමර්ශන වාර්තා හා ශක්‍යතා වාර්තා ලබාගැනීම සිදුකර තිබුණි. | ආර්ථික සංවර්ධන නිලධාරී විසින් පරීක්ෂා කරන අවස්ථාවේදී කරන ලද වැඩ කොටස් දක්වමින් අදාළ පූර්ව විමර්ශන වාර්තා ලබාදී ඇත. | ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වීම. |
| (v) | පුහුල්වැල්ල මහා විද්‍යාලයේ ක්‍රීඩාපිටිය හා දිවා රාත්‍රී වොලිබෝල් පිටි යන ව්‍යාපෘති දෙකම ක්‍රියාත්මක කිරීමට පෙර, විදුහල්පතිවරයාගේ සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබූ අතර ව්‍යාපෘති දෙකම අවසන් කර තිබුණද විධිමත් පරිදි විදුහල්පතිවරයාට භාරදී නොතිබුණි. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී තීරණය වූ යෝජනාවක් බැවින් අදාළ අනුමැතීන් ලබා ගෙන නැත. | ව්‍යාපෘතිවල අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවය ලබාදී ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (vi) | මුරුතමුරය පොදු ක්‍රීඩාංගනයේ පිහිටි වොලිබෝල් ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය අධීක්ෂණය කරනු ලැබූ කාර්මික නිලධාරීගේ වාර්තාව අනුව එම ව්‍යාපෘතිය අවිච්ඡේද කරන ලෙස ඉල්ලා සිටියද ඒ පිළිබඳව අවධානය යොමු නොකර දැල ගැසීමේදී වර්ග මීටර් 23.56 ක් වැඩිපුර මිනුම් කර තිබූ අතර, විෂය අංක $B_4$ අනුව ඝණ මීටර් 50.55 ක් පස් දමා තැලීම සිදුකර නොතිබුණි. | ව්‍යාපෘතිය අවිච්ඡේද කර ඇති බවත් කොටස් මුදල් ගෙවීමක් පමණක් සිදුකර ඇත. | මෙම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෝටර්රථ ප්‍රවාහන කාර්යාලයේ රියදුරු බලපත්‍ර සඳහා බැංකුව වෙත මුදල් ගෙවීමේදී එක් රියදුරු පාසලක් විසින් | මීට සම්බන්ධ රියදුරු පාසලට එරෙහිව නඩු පවරා ඇත. | පවතින අභ්‍යන්තර පාලනය ශක්තිමත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | රු.649,200 ක මුදලක් අයතා පරිදි ලබාගෙන තිබුණ ද මේ පිළිබඳව නීති ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, ඊට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධවද නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ඇ) | මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් කෝවිඩ් -19 වසංගතය හේතුවෙන් ජන ජීවිතය පවත්වාගෙන යාමට අපහසු වූ පවුල් / පුද්ගලයින් සඳහා රු.5,000 දීමනාව ගෙවීම | | |
| (i) | තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කිතලගම නැගෙනහිර III ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරී විසින් ප්‍රතිලාභීන් 16 කට අදාළ රු.5,000 දීමනා හා ප්‍රතිලාභීන් 07 කට අදාළ වැඩිහිටි දීමනා එකතුව රු.116,700 ක් නියමිත දිනදී ප්‍රතිලාභීන් වෙත ලබා දී නොතිබුණි. පිළිවෙලින් දින 56 ක් හා දින 65 ක් දක්වා කාලයක් අත රඳවාගෙන අදාළ මුදල් ප්‍රතිලාභීන්ට නියමිත පරිදි ලබාදී තිබූ බවට දැක්වෙන අත්සන් ලේඛන සාවද්‍යා ලෙස සකස් කර තිබුණි. | චූදිත නිලධාරිනිය සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ ක්‍රියාත්මක වෙමින් පවතී. | මෙවැනි තත්ත්වයන් මගහරවා ගැනීමට අවශ්‍ය අධීක්ෂණයත් අභ්‍යන්තර පාලන ක්‍රමයත් ශක්තිමත් කළ යුතු වීම. |
| (ii) | පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් හුලංකන්ද ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරී විසින් ප්‍රතිලාභීන් 03 කට අදාළ එකතුව රු.15,000 ක් සහ මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් රු.5,000 ක් වශයෙන් එකතුව රු.20,000 ක් අදාළ ප්‍රතිලාභීන්ට ගෙවා ඇති බවට වූ සාවද්‍යා අත්සන් ලේඛණ සකස් කර මුදල් ළඟ තබාගෙන තිබුණි. | මෙම නිලධාරිනිය සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කිරීමට නියමිතව ඇත. | මෙවැනි තත්ත්වයන් මගහරවා ගැනීමට අවශ්‍ය අධීක්ෂණයත් අභ්‍යන්තර පාලන ක්‍රමයත් ශක්තිමත් කළ යුතු වීම. |
| (iii) | 2020 අප්‍රේල් 16 දිනැති අංක DSH/HO/DG/චක්‍රලේඛ දරන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව “ඇඳිරි නීතිය” ක්‍රියාත්මකවීම මත ස්ථිර පදිංචි ස්ථානයෙන් බැහැරව වෙනත් ස්ථානයක නැවතී සිටින සමෘද්ධි සහනාධාරලාභීන්ට හිමි එකවර ගෙවනු ලබන සමාජ ප්‍රතිලාභ රු.5,000 ක දීමනාව, සහනාධාරලාභියාගේ ලිඛිත ඉල්ලීමක් මත පදිංචි නිවසේ ජීවත්වන සමීප ඥාතියෙකු වෙත ගෙවීමට හෝ එම සහනාධාරලාභියාගේ සාමාජික තැන්පත් ගිණුමට බැර කිරීමට කටයුතු කළයුතු වුවද, පස්ගොඩ ප්‍රාදේශීය | අප්‍රේල් මාසයේදී මෙම පුද්ගලයින් අදාළ ගමෙහි පදිංචිව නොසිටි බවත් මැයි මාසයේදී පදිංචිවී සිටි බැවින් අදාළ මුදල ගෙවූ බවත් දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ලේකම් කාර්යාලය විසින් එසේ කටයුතු කර නොතිබුණි. ග්‍රාම නිලධාරී වසම් 03 ක ප්‍රතිලාභීන් 15 දෙනෙකු සඳහා චක්‍රලේඛ ප්‍රකාරව අප්‍රේල් සහ මැයි මාසයන්ට අදාළව එකතුව රු.150,000 ක් ගෙවා නොතිබුණි. | | |
| (iv) | ග්‍රාම නිලධාරී වසම් 07 ක සමෘද්ධි ප්‍රතිලාභීන් 31 දෙනෙකු සඳහා අප්‍රේල් මසට අදාළව ගෙවිය යුතු දීමනාවල එකතුව රු.155,000 ක් ගෙවා නොතිබුණු අතර මැයි මසට අදාළ මුදල පමණක් ගෙවා තිබුණි. | විවිධ හේතූන් මත මෙම තත්ත්වයන් සිදුවී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවී සහන ණය පියවර යටතේ රජයේ සේවයේ නිලධාරීන් සහ විශ්‍රාමික රජයේ සේවයේ නිලධාරීන් 06 දෙනෙකුට එකතුව රු.30,000 ක් ගෙවා තිබුණු අතර විගණන දිනය වූ 2021 මාර්තු 31 දින වන විටත් එම මුදල් ආපසු අයකරගෙන නොතිබුණි. | අනිවාර්ය තැන්පත් ගිණුමේ ශේෂය පදනම් කරගෙන ණය කොන්දේසිවලට යටත්ව ණය මුදල් ගෙවා ඇති බවත් ඒවා නැවත අයකර ගැනීමට කටයුතු කරන බවත් දක්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | වරාය සහ නාවික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක සිංහරාජ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ කොන්ක්‍රීට් මාර්ගයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 5.9 ක් වූ ගිවිසුම් වටිනාකමට පෞද්ගලික ආයතනයක් සමඟ 2019 ජූලි 05 දින ගිවිසුම්ගතවී තිබූ අතර 2019 සැප්තැම්බර් 03 දින වන විට කොන්ත්‍රාත්තුවේ වැඩ ගිවිසුම් ප්‍රකාරව අවසන් කළයුතු විය. එහෙත් කොන්ත්‍රාත්කරු විසින් එදිනට වැඩ අවසන් කර නොතිබුණු බැවින් 2019 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්තුවට අදාළ කාර්යසාධන සුරක්ෂණයේ වලංගු කාලය ඉකුත්වී තිබුණු රු.296,417 ක වටිනාකමින් රු.130,998 ක් අයකර ගැනීමට නිලධාරීන්ට නොහැකි වී තිබුණි. එබැවින් කොන්ත්‍රාත්කරු වෙත ගෙවූ රු.475,146 ක් වූ වියදම් නිෂ්කාර්ය වී තිබුණි. | මෙම මුදල අයකර ගැනීමට කටයුතු කරමි. | කඩිනමින් මෙම මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර ඉටු නොකර අත්හැර දමන ලද ව්‍යාපෘතීන්හි කටයුතු අවසන් කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන 2018 යටතේ රු.මිලියන 1557.94 ක අනුමත ප්‍රතිපාදනයෙන් 2019 වර්ෂය තුළදී රු. මිලියන 300 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. එම ප්‍රතිපාදන මත සිදුකරනු ලැබූ මාර්ග සංවර්ධන ව්‍යාපෘතීන් 03 ක් සඳහා ගිවිසුම්ගත වූ එක් සමාගමක් විසින් ලබාදී තිබූ රු. මිලියන 17.0 ක් වූ අත්තිකාරම් බැඳුම්කර 02 ක් හා රු. මිලියන 5.9 ක් වූ කාර්යසාධන බැඳුම්කර 03 ක් ව්‍යාජ ඒවා බව තහවුරු වූ අතර කොන්ත්‍රාත්කරුවන් විසින් මේ වනවිට මෙම ව්‍යාපෘති අතහැර දමා තිබුණි. වගකිවයුතු නිලධාරීන් විසින් අවශ්‍ය අවස්ථාවලදී නිසි අවධානය යොමු නොකිරීම හා ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු විසින් සිය වගකීම් නිසි පරිදි ඉටුකර නොතිබීම මීට හේතුවී තිබුණි. | අපරාධ විමර්ශන අංශයෙන් කරගෙන යනු ලබන පරීක්ෂණයට අදාළව අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇත. | මේ සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

---------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 සම්බන්ධයෙන් 2020 වර්ෂය තුළදී ද නිසි අවධානය යොමුකර නොතිබුණි.වර්ෂය තුළ ලද ප්‍රතිපාදන මත පදනම්ව තිරසාර සංවර්ධන අරමුණු 3 ක් හඳුනාගෙන තිබුණු අතර තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ට අනුව අරමුණු 14 ක් කෙරෙහි කිසිදු අවධානයක් යොමුකර නොතිබුණි. | ඉදිරියේදී අරමුණු 14 හඳුනා ගනිමින් තිරසාර සංවර්ධන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරමි. | තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අවධානය යොමුවිය යුතු වේ. |

## 5. යහපාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛයෙන් හඳුන්වාදී ඇති පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කළයුතු වුවද මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 1733 ක් ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 1623 ක්ද වූයෙන් කාර්ය මණ්ඩලයෙහි පවතින 141 ක පුරප්පාඩු පියවා ගැනීමට හා 31 දෙනෙකුගෙන් යුතු අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර ඇත. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පුරවා ගැනීමටත්, අතිරික්තතා විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. |
| (ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන ලේකම්ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම ඉහත චක්‍රලේඛයෙහි ඇමුණුම 1 ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | ඉදිරියේදී මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |